# අරමුදල් ආකෘතියේ විශේෂාංග (FUNDING MODEL FEATURES)

**මූල්‍ය ආයතනයක් ලෙස ගෝලීය අරමුදලේ ලක්ෂණ ගැන දැනගැනීම සහ ප්‍රජාවන් සහ අධි අවධානම් කණ්ඩායම් සදහා මෙය වැදගත් වන්නේ කෙසේද ?**

HIV,ක්‍ෂයරෝගය, හා මැලේරියා මර්ධනය සම්බන්ධ ගෝලීය අරමුදල, එකී ආසාධන නිවාරණ වැඩපිළිවෙලවල් සඳහා දැනට ලොව පවතින විශාලතම මූල්‍ය ආයතනයයි. ගෝලීය අරමුදලේ දායකත්වය මගින් 2016 අවසාන වන විට, HIV, ක්‍ෂය රෝගය, හා මැලේරියා ආසාධන නිවාරණය හා රෝග ආසාධිත පුද්ගලයින් හට විධිමත් රෝග විනිශ්චයන් හා ප්‍රතිකාර ලබා දීමටත්, එමගින් මිලියන 22ක ජීවිත බේරා ගැනීමටත් පාදක ඇති කරන ලද ව්‍යාපෘති සකස් කර ඇත. පහත දැක්වෙන්නේ සිවිල් සංවිධාන, ප්‍රජාවන්, හා අධි අවදානම් කලාපයේ පුද්ගලයින් විසින් නිතර සිතෙහි තබා ගත යුතු අරමුදල් ආකෘතියේ විශේෂාංග පිළිබඳ දැක්වෙන වැදගත් කරුණු කිහපයකි.

## එය ප්‍රතිපාදන මත පදනම් වේ (It is allocation-based)

ගෝලීය අරමුදල වසර 3ක කාලසීමාවකට යටත්ව ආධාර ලබා දීමට සුදුසු රටවල් වෙන් කර ගනු ලැබේ (මෙය ප්‍රතිපාදන කාලසීමාව ලෙසද හැඳින්වේ). එවන් රටක් තුල පවතින අදාල ආසාධනය පදනම් කරගෙන මෙම ප්‍රතිපාදන සකස් කර ගනු ලැබේ. මෙම ප්‍රතිපාදන වෙත පිවිසීමට අයදුම්පත් කරුවන් හට එම අදාල වසර 3ක කාලසීමාව තුල හැකිවේ. මෙම ක්‍රමවේදය මගින් ඒ ඒ අදාල ආසාධනය සම්බන්ධව කොපමණ මුදලක් වෙන් විය යුතුද යන්න තීරණය වන අතරතුර, එම ආසාධන බෙදී යාම පිළිබඳ ගන්නා තීරණ (ඒ ඒ රටෙහි සුදුසුභාවය අනුව කොපමණ අරමුදලක් HIV, ක්‍ෂය රෝගය, හා මැලේරියා ආසාධන වෙත වෙන් කල යුතුද, හෝ තිරසාර හා නම්‍යශීලී සෞඛ්‍ය සේවාවන් ඇති කරලීම වැනි තීරණ) ඒ ඒ රට අනුව වෙනස් වේ.

**ප්‍රජා මගපෙන්වීම**

මෙම වසර 3ක කාලසීමාවක් තුල ප්‍රතිපාදන ලබාදීමේ ක්‍රියාදාමය සිදුවන්නේ රටක රෝග නිර්ණ ක්‍රමෝපායන්, ක්‍රියාත්මක කිරීම සඳහා සැකසුනු කාලරාමු සමග ගැලපේ දැයි පිරික්සීම සමගින්ය. මෙමගින් අදහස් වන්නේ ජාතික ක්‍රමෝපාදන සැලැස්ම ක්‍රියාත්මක කිරීමට උපකාර වීමයි.

- මෙම ක්‍රමවේදය, රෝග නිවාරණ වැඩසටහන් සඳහා අවශ්‍ය ස්වදේශීය සම්පත් සොයා ගැනීම පිළිබඳව දේශීය සාකච්ඡා තුල කතා බහට ලක්වීම සඳහාද ඉඩකඩ විවර කර දේ. මෙම ප්‍රතිපාදන, රටක ආර්ථික තත්වය මත පමණක්ම නොව, රෝග නිවාරණ වැඩසටහන් සඳහා මෙම ප්‍රතිපාදන සම්පාදනය සම්බන්ධව දායක වන පාර්ශවයන්ගේ පවතින කැපවීම මතද රඳා පවතී.

## එය, රෝගාබාධ වැඩසටහන් සඳහා අරමුදල් සැපයීම සඳහා ආයෝජන ප්‍රවේශයක් අනුගමනය කරයි (It follows an investment approach to fund disease programmes)

මෙවන් ආකෘතියක් මගින් රෝග නිවාරණ ක්‍රමෝපායන් වඩාත් ශක්තිමත් කරන අතර, මෙහි අරමුණ වන්නේ රෝග නිවාරණ වැඩසටහන් හොඳින් ක්‍රියාත්මක කිරීම සඳහා යෙදවූ සම්පත් භාවිතයෙන් උපරිම ඵල නෙලාගත් බව තහවුරු කිරීමයි. අරමුදල් අයදුම් ඔවුන්ගේ මුදල් ප්‍රතිපාදන සම්බන්ධ කාර්යක්ෂමතාව පැහැදිලි කල යුතු අතර, සම්පත් ඒ ඒ රෝග, හා ඒ ඒ ජනගහන වෙනුවෙන් නිවැරදිව වෙන් වූ බවත් තහවුරු කිරීම සිදු කල යුතු වේ. අධි අවදානම් කලාප වෙත යොමු කරන අවධානයත්, ආර්ථිකමය වාතාවරණය, හා රෝග ව්‍යාප්තියේ ඇති අවදානම පිළිබඳවත් තොරතුරු ඇතුලත් තත්ව වාර්තාවකින් අරමුදල් වෙන් කිරීමේ හා ලබාදීමේ ප්‍රමුඛතාවය කොපමණද යන්න තීරණය වේ.

**ප්‍රජා මගපෙන්වීම**

ප්‍රතිපාදනය සම්බන්ධ කාර්යක්ෂමතාව රෝග නිවාරණ වැඩසටහන් අධි අවදානම් පුද්ගලයන් පාදක කරගන්නා බව තහවුරු කර ගැනීම වැදගත් වේ. මෙමගින් කියවෙන තවත් දෙයක් නම්, රෝග නිවාරණ වැඩසටහන් වෙත අධි අවදානම් පුද්ගලයන් ඇතුලත් කර ගැනීමේදී මානව හිමිකම් හා ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාව වැනි ඉතා වැදගත් සාධක ද මෙහි ඇතුලත් වන බව සැක හැර දැනගත යුතුය යන්නයි.

## ගෝලීය අරමුදලේ මූල්‍යමය දායකත්වය කාර්‍ය සාධනය මත පදනම් වේ

## (Global Fund financing is performance-based)

ගෝලීය අරමුදලේ මූල්‍යමය දායකත්වය සිදු කරන්නේ, මූල්‍ය ප්‍රදානය සඳහා සිදු කල අයදුම් අනුමත වූ පසුවද (ප්‍රතිපාදන කාලසීමාව අතරතුරද), අයදුම්කරුවන්ගේ කාර්‍ය සාධනය මත පදනම්ව පමණි. ප්‍රතිපාදන කාලසීමාව තුල අරමුදල් නිකුත් කිරීම හා අරමුදල් ප්‍රමාණය රඳා පවතින්නේ ප්‍රතිපාදන සකස් කරන්නන්ගේ එම අරමුදල් යොදාගැනීමේත්, ඒ ඒ අදාල අරමුණු කරා ලඟා වීමේත් කාර්‍යක්ෂමතාවය හා ඵලදායිතාව මත වේ.

**ප්‍රජා මගපෙන්වීම**

කාර්‍ය සාධනය මත පදනම් වූ ක්‍රමවේදයක් ඇති කිරීමට නම් කාර්‍යක්ෂම හා පරිපූර්ණ සැලසුම් පද්ධතියක් පැවතිය යුතුයි. අඩු වියදම් හා වැඩි වියදම් යනාදී සාධක මෙහිදී වැඩසටහන් වල ඵලදායිතාව මැනීමට වැදගත් වේ. වැඩසටහන් වල සංස්කරණ කටයුතු සඳහා ඉඩ ප්‍රස්ථාවක් පවතින අතර, එවන් වෙනස්කම් සිදු වන්නේ නම් ඒ හා ගැලපෙන හා ප්‍රමාණවත් තරම් සාක්ෂි ඉදිරිපත් කල යුතුයි.

වැඩසටහන් වල අරමුණු හා පෙන්වන කරුණු පිළිබඳ ඉතාමත් සැළකිලිමත් විය යුතු වේ, මන්ද එම කරුණු මගින් අදාල වැඩසටහන් වල සාර්ථකභාවය මැනෙනු ලැබේ. මානව හිමිකම් හා ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවය, හෝ වෙනත් ඒ හා අදාල ඕනෑම කරුණක් පිළිබඳ වැඩසටහනක් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ කරුණු වෙන වෙනම මැනිය හැකි දර්ශක අනිවාර්යයෙන්ම ඉදිරිපත් කල යුතුවේ.

## එය අනුගමනය කරන්නේ විධිමත් හා විනිවිදභාවයකින් යුත් ක්‍රමවේදයකි
## (It uses an iterative and streamlined process)

ජාතික ක්‍රමෝපායන් සඳහා රටක සිදුවන ක්‍රියාවලීන් වටා අරමුදල් ආකෘතිය ගොනුවී ඇති අතර, එය අදාල වැඩසටහන් ක්‍රියාවට නැංවීම පිළිබඳව අවධානය යොමු කරයි. අරමුදල් අයදුම් කිරීමේ ක්‍රියාවලිය සකස් කර ඇත්තේ, ක්‍රියාවට නැංවීම සඳහා පාර්ශවකරුවන් හට වැඩි අවධානයක් යොමු කිරීමට මාස 6 සිට 9 දක්වා කාලයක් ගතවන ලෙසටයි. අරමුදල් අයදුම් දේශීය සංවාද තුල ඇති කර ගන්නා එකඟතාවයන් හා සැලසුම් අනුව පාදක විය යුතුවේ. එය රාජ්‍ය හා රාජ්‍ය නොවන පාර්ශවකරුවන් ඒකරාශී කර ගැනීම සඳහා සැකසුනු පුළුල් උපදේශන යාන්ත්‍රණයක් විය යුතුවේ. එමෙන්ම දැනට පවතින වැඩසටහන් ඇගයීම සඳහා සැකසුනු ක්‍රියාදාමයක්ද විය යුතුවේ. ඵලදායිතාව හා වැඩපිළිවෙලවල් වල ස්වභාවය අනුව දේශීය පාර්ශවකරුවන් හට වැඩසටහන් වෙනස් කිරීමට හැකියාව පවතී.

මෙහි පවතින මෙම විනිවිදභාවය නිසා, අරමුදල් ආකෘතිය ස්වයංසිද්ධවම හැඩගැසෙන හා ප්‍රතිසංස්කරණය වන අතර, ක්‍රියාත්මක වීමේදී ඇතිවන ගැටළු නිරාකරණය වීමද මෙහිදී සිදුවේ. උදාහරණයක් වශයෙන්, ආකෘතිය නිර්මාණයේදී ඇති වූ වැදගත් සංස්කරණයක් ලෙස, පෙර පැවති සියළු අරමුදල් අයදුම් සඳහා යොදා ගත් තනි මාර්ග ප්‍රවේශය, දැන් (එනම් මීලඟ ප්‍රතිපාදන කාලසීමාවේදී) විවිධ මාර්ග ඔස්සේ ප්‍රවේශ විය හැකි පරිදි සංස්කරණය කිරීම දැක්විය හැකිවේ. එමෙන්ම, එහිදී තාක්ෂණික වශයෙන්ද සමාලෝචනයක් සිදුවන අතර, එමගින් රටෙහි ප්‍රතිපත්ති වඩා හොඳින් අවබෝධ කර ගැනීමටත්, ඒ ඒ රට වලට තවත් විධිමත් අයුරින් ක්‍රියාවලියට දායක වීමටත් පහසු වේ.

**ප්‍රජා මගපෙන්වීම**

- වැඩසටහන් සංවිධානය කිරීමේදී තමන්ගේ භූමිකාව පිළිබඳ විස්තර කිරීමටත්, මුල් අවධියේදීම සංවිධානය කිරීමටත්, තීරණාත්මක ප්‍රතිඵල වාර්තා කිරීමටත්, වලංගු සාක්ෂි ඉදිරිපත් කිරීමටත්, හා අනෙකුත් පාර්ශවකරුවන් හට අවශ්‍ය මග පෙන්වීම ලබා දීමටත්, සිවිල් සංවිධාන, ප්‍රජාවන්, හා අධි අවදානම් ප්‍රජාවන් හට දායක විය හැකිය. මෙමගින් අරමුදල් ආකෘතිය වැඩිදියුණු කල හැක.
- මෙම ක්‍රියාදාමයේදී, සිවිල් සංවිධාන, ප්‍රජාවන්, හා අධි අවදානම් ප්‍රජාවන්ගේ දායකත්වය ලබා ගැනීම සඳහා ඉඩ සලසා දීම ඉතා වැදගත් වේ. සූක්ෂමවූත්, උපායශීලීවූත් සැලසුම් කිරීම මගින්, ජාතික හා අන්තර්ජාතික මට්ටමින් පවා ප්‍රජා සහභාගීත්වය ඇති කර ගැනීමට මෙම යාන්ත්‍රණයන් යෝග්‍ය වේ.

## එය නිර්මාණය කර ඇත්තේ විවිධ පාර්ශවකරුවන් අතර අන්තර් සහයෝගය ඇතිකරලීමටයි. (It is designed for collaboration among different stakeholders)

අරමුදල් ආකෘතිය තුල CCM යාන්ත්‍රණය (ගෝලීය අරමුදල මගින් රටක් තුල ස්ථාපිත කර ඇති බහුවිධ ආයතනයකි) අරමුදල් අයදුම් සංවර්ධනය කිරීම, PR (principal recipient) සහභාගී කරවා ගැනීම, හා ආධාර ප්‍රදානය අධීක්ෂණය යනාදිය පිළිබඳ මූලික වගකීම දරයි. එබැවින්, අරමුදල් ආකෘතිය CCM යාන්ත්‍රණය රටක් තුල ප්‍රධාන පාලන ව්‍යුහය වීම පිළිබඳ තම විශ්වාසය තබා පවතී.

## එය එහි පවතින තිරසාර සැලසුම් විදහා පායි (It incorporates sustainability in its design)

ගෝලීය අරමුදල් මූල්‍ය ප්‍රතිපාදන හමුවේ තිරසාර බව ඉතා වැදගත් ස්ථානයක් ගනු ලබයි. එබැවින්, ආර්ථික මට්ටම හෝ රෝග ව්‍යාප්ත අවදානම කුමන මට්ටමක පැවතියත්, ගෝලීය අරමුදලට අයදුම් කිරීමට සුදුසු සෑම රටක්ම අරමුදල් අයදුම් කිරීමේදී තිරසාරත්වයට ප්‍රමුඛතාවය දිය යුතුමයි. එමෙන්ම, ඔවුන්ගේ රෝග නිවාරණ වැඩසටහන් සඳහා අවශ්‍ය දේශීය අරමුදල් වැඩි කරගන්නේ කෙසේද යන්න පිළිබඳ සංවාද ඇති කර ගැනීමට උනන්දු වීමත්, පරිත්‍යාග සොයා ගැනීමත් මෙහිදී අපේක්ෂා කෙරේ.

අඩු ආදායම් හා ආසාධන කෙරේ වැඩි බර පවතින රටවල් ඔවුන්ගේ සෞඛ්‍ය පද්ධතීන් තිරසාර කිරීම සඳහා ආයෝජනය කිරීම වැදගත් වේ. මධ්‍යම ආදායම් රටවල්, ආසාධන කෙරේ පවතින බර කුමක් වුවත්, වැඩසටහන් හා ඒවාහි අන්තර්ගතය සම්බන්ධව ප්‍රගතිශීලී ප්‍රතිපත්තියක් අනුගමනය කල යුතුයි. මේ අතර මානව සම්පත් අවශ්‍යතා, අත්‍යාවශ්‍ය ඖෂධ ගෙන්වා ගැනීම, හා මානව හිමිකම් හා ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවයට බාධා පමුණුවන්නන් අවම කිරීම සඳහා වැදගත් වන නව අදහස් හා යෝජනා මුල් තැනක් ගත යුතු වේ.

**ප්‍රජා මගපෙන්වීම**

- තිරසාරත්වය, සංක්‍රමණය , හා සම-මූල්‍ය අවශ්‍යතා ගෝලීය අරමුදල් නොවන වැඩසටහන් සඳහා වැදගත් වන්නේ, ඔවුනද අධි අවදානම් කලාප හා ප්‍රජා අවශ්‍යතාවන්ට සංවේදී බව තහවුරු කර ගැනීම උදෙසා වේ.
- දැනට පවතින ගෝලීය අරමුදල් ක්‍රමෝපායට අනුව, ගෝලීය අරමුදලේ සහයෝගයෙන් බැහැරව සිදුකරන ප්‍රතිපාදන අසීරු වන අතර, ණය පහන් වන විට සූදානම්ව පවතින්නේ නැත. තිරසාරත්වය පිළිබඳව පැන නගින ගැටළු (උදාහරණයක් වශයෙන් ගෝලීය අරමුදලෙන් පරිභාහිර වන විට රටවල් විසින් අධි අවදානම් කලාප වෙත පැවති අවධානය බිඳ නොවැට පවත්වා ගෙන යාම), දැනට පවතින අරමුදල් අයදුම් ක්‍රියාදාමය තුලදී සාකච්ඡාවට බඳුන් විය යුතු අතර, දේශීය සංවාද තුලටද ඇතුලත් විය යුතුය.

## එය එකකට එකක් වෙනස් ප්‍රවිශ්ය ගනු ලබයි (It follows 'differentiated' approaches)

සංවර්ධනය ඒ ඒ රටවල විවිධ හේතු මත "විවිධ ආකාර හා විවිධ වේගයන්" ගෙන් සිදුවන බව ගෝලීය අරමුදල විසින් හඳුනාගෙන පවතී. මෙමගින් අදහස් වන්නේ, ගෝලීය අරමුදල් ක්‍රමෝපායන් සාර්ථක වීමට නම් ආයෝජනයට ලබා දිය යුතු ප්‍රමුඛතාවන් හා ඒ ඒ රට වල ව්‍යුහයන් අනුව තම යාන්ත්‍රණ වෙනස් කල යුතු බවයි.

අරමුදල් ආකෘතියේ විවිධ පැතිකඩවල් තුලින් ක්‍රම විවිධාංගීකරණය සිදුවේ. අරමුදල් සඳහා සුදුසු රටවල් මෙහිදී "ඉලක්කගත" ("Focused"), "කේන්ද්‍රීය" ("Core"), හා "අධි බලපෑම්" ("High Impact") ලෙස, ඒවාහි ආයෝජන හා ආසාධන අවදානම් මට්ටම් අනුව*, වර්ගීකරණය කර ඇත. මෙය රටක අරමුදල් අයදුම් කිරීම සම්බන්ධ ක්‍රියාදාමයන් හා ඒ හා සම්බන්ධ සමාලෝචන කිරීම් තීරණය කිරීම සඳහා උපකාරී වනු ඇත.දැන් වන විට, අරමුදල් ආකෘතියේ අරමුදල් අයදුම් හා සමාලෝචනයන් සඳහා විවිධාංගීකරණය වූ ප්‍රවිශ්ය සැකසී පවතී; "අඛණ්ඩව වැඩසටහන් පැවැත්වීම " ("Programme Continuation"), එහිදී වැඩසටහන් ව්‍යුහයට කිසිදු වෙනසක් සිදු නොවී, අරමුදල් අයදුම් ක්‍රියාවලියේ පමණක් යම් වෙනස්කම් ඇති කරමින් දිගටම රට තුල ආවරණය කරයි; "උචිත අයදුම් හා සමාලෝචනය" ("Tailored Application and Review"), එහිදී විශේෂිත දේශීය සංකල්ප (අභියෝගාත්මක මෙහෙයුම් වටපිටාවන්, නව්‍යකරණය වූ මූල්‍ය ප්‍රතිපාදන ක්‍රමවේද, හෝ ගෝලීය අරමුදලින් බැහැරව සහය පැතීම වැනි දෙය) ආවරණය කරයි; අවසාන වශයෙන් "පරිපූර්ණ යෝජනාවලිය හා සමාලෝචනය" ("Full Proposal and Review"), එහිදී අරමුදල් අයදුම් හා බැඳි වැඩසටහන් හා උපාය මාර්ග පිළිබඳ පුළුල් විමර්ශණයක් අවශ්‍ය වේ. ප්‍රවිශ්යය අනුව අයදුම්පත් වල ස්වභාවය තීරණය වනු ඇත.

විවිධාංගීකරණයේදී CCMහි අරමුදල් අයදුම් කිරීම සඳහා ඇති යෝග්‍යතාව ද ඇගයීමකට ලක් කරනු ලැබේ (අවශ්‍යතා 2ක් සඳහා මෙම ඇගයීම සිදු කරයි); PR උදෙසා විනිවිදභාවයකින් යුතුව තෝරා ගැනීමත්, අරමුදල්

අයදුම් සංවර්ධනය කිරීමත් සඳහා සහභාගීත්ව ක්‍රියාවලියක් ඇති කල යුතුයි. “සම්මත සමාලෝචනයක්” (“Standard Review”), හා “සැහැල්ලු (හෝ ඉතා සැහැල්ලු) සමාලෝචනයක්” (“Light/ or Super Light Review”) අපේක්ෂා කෙරේ. අවශ්‍යතා වලට තම ගැලපීම සම්බන්ධ ලිඛිත, ප්‍රකාශිත හා විධිමත් වාර්තාවක් ඉදිරිපත් කිරීම සම්මත සමාලෝචනයක් ලෙස හැඳින්වෙන අතර, අවශ්‍යතා වලට තම ගැලපීම සම්බන්ධ ප්‍රකාශයක් පමණක් ඉදිරිපත් කිරීම සැහැල්ලු (හෝ ඉතා සැහැල්ලු) සමාලෝචනයක් ලෙස හැඳින්වේ. මෙම ප්‍රවේශයන් 2හි අවශ්‍යතාව අවස්ථාව අනුව වෙනස් වේ. ඒ, CCMහි වාර්ශික සුදුසුකම් හා කාර්යසාධන ඇගයීමේ ප්‍රතිඵල, PR හි කාර්ය සාධනය, හෝ ඒ අදාල රට කුමන ප්‍රවිශ්ඨය ලබා ගන්නේද යන කාරණා වලට අනුවයි.

**ප්‍රජා මගපෙන්වීම**

විවිධාංගීකරණය මූලික වශයෙන්ම ප්‍රජා-මූලික සංවිධාන සහ අධි අවදානම් කලාප පුද්ගලයින් හට සම්බන්ධ වීමට දොරටු විවර නොකරන මුත්, දේශීය ව්‍යුහයන් තුල ඔබගේ CCM සඳහා කුමන ප්‍රවිශ්ඨය ලබා ගත්තේද යන්න මත (සම්මත හෝ සැහැල්ලු/ඉතා සැහැල්ලු) මෙය රඳා පවතී.

ඒ ඒ රට වලට විවිධ ව්‍යුහයන් පවතින බව විවිධාංගීකරණ ක්‍රියාවලියෙන් පැහැදිලි වේ. කෙසේ වෙතත්, මෙම ප්‍රවිශ්ඨ වලින් අදහස් වන්නේ සහභාගීත්වය සඳහා විවිධ පාර්ශවකරුවන් උවමනා බවයි. උදාහරණයක් වශයෙන් සංක්‍රමිත රටවල් සඳහා විවිධ සංක්‍රමිත සැලසුම් උත්පාදනය විය යුතු අතර මේ සඳහා පාර්ශවකරුවන්ට ක්‍රියා කල හැක.

ප්‍රවේශයන් පිළිබඳව සහාය සහ පැහැදිලි කිරීම රටවල් කණ්ඩායම් හෝ ප්‍රාදේශීය CRG ක්‍රමයන් වෙතින් ලබාගත හැකිය.

*“ඉලක්කගත රටවල්” *(Focused Countries)* යනුවෙන් හඳුන්වන්නේ ඇමරිකන් ඩොලර් මිලියන 75ට වඩා අඩු ප්‍රතිපාදන හා ආසාධන කෙරේ අඩු බරක් පවතින රටවල්ද, “කේන්ද්‍රීය රටවල්” *(Core Countries)* යනු ඇමරිකන් ඩොලර් මිලියන 75ට වඩා වැඩි මුත් 400ට වඩා අඩු ප්‍රතිපාදන හා ආසාධන කෙරේ වැඩි බරක් පවතින රටවල්ද, “අධි බලපෑම් රටවල්” *(High Impact)* යනු ඇමරිකන් ඩොලර් මිලියන 400ට වඩා වැඩි ප්‍රතිපාදන හා ආසාධන කෙරේ තීරණාත්මක කඩඉමක පසුවන රටවල්ද වේ.